සැ. යු. : (i) 2025.08.29 දින පළ කරන ලද අංක 2452 ගැසට් පත්‍රයේ III සහ IV අ කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,453 - 2025 සැප්තැම්බර් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2025.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 1742 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 1758 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 සැප්තැම්බර් මස 26 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 සැප්තැම්බර් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1739- B 82714— 5,403 (2025/08)
F 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

### පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

**පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ සංචාරක බංගලා භාරකරු තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2025**

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ, නුවරඑළියේ පිහිටි සංචාරක බංගලාව සඳහා, ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ සංචාරක බංගලා භාරකරු තනතුරේ පවතින පුරප්පාඩුව (01) සම්පූර්ණ කිරීමට මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. බඳවා ගැනීමේ ක්‍රමය :

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත, මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

2. අවශ්‍ය සුදුසුකම් :

(i) අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06)සමත් වී තිබීම.

(ii) පළපුරුද්ද :

අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(iii) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

(iv) වෙනත් සුදුසුකම් :

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

*සටහන* :- මූලික සුදුසුකම සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය.

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියෙහි සඳහන් ආකාරයට පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

iii. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබාගත යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට ද ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද ඔබ යටත් විය යුතුවේ.

v. අයදුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම් පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

4. *වයස් සීමාව* :

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

5. *වැටුප් පරිමාණය* :

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

**රු. 40,000–10x450–10x490–10x540-12x590- රු.61880/- (PL-1-2025)**

ක් වන අතර එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මකවන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

6. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ. (තෝරාගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය ලකුණු 50 කි)

| *අනු. අංකය* | *විෂය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| **01.** | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :**<br>**සටහන :** ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටීම.<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත් වීම. | <br><br><br>10<br>20 | **20** |
| **02.** | **සේවා පළපුරුද්ද :**<br>රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය හෝ ව්‍යවස්ථාපිත ආයතනවල හෝ පෞද්ගලික අංශයේ හෝටල් / ආපනශාලා හෝ මෙම තනතුරට සමාන තනතුරක අවම වශයෙන් මාස 06ක පළපුරුද්ද.<br>රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ කිසියම් හෝ තනතුරක අවම වශයෙන් මාස 03ක සේවා පළපුරුද්ද. | <br>20<br><br>10 | **30** |
| **03.** | **තනතුරට අදාළ ක්ෂේත්‍රයක, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ තෘතීයික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් මාස 03කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක්.** | <br><br>25 | **25** |
| **04.** | **රාජ්‍ය භාෂාව නොවන භාෂා පාඨමාලා හදාරා තිබීම :**<br>**සටහන :** ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව පිළිබඳව පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම. (තනතුරට බඳවාගනු ලබන භාෂා මාධ්‍යයට අමතරව)<br>මාස 03කට නොඅඩු මාස 06කට නොවැඩි කාලසීමාවක් සඳහා.<br>මාස 06කට වැඩි කාලසීමාවක් සඳහා. | <br><br><br><br><br>10<br>20 | **20** |

| *අනු. අංකය* | *විෂය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| **05.** | **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා හා පෞරුෂය :** | | **05** |
| | සාමාන්‍ය දැනීම හා බුද්ධිය. | 02 | |
| | විවිධ භාෂා හසුරුවමින් පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ පෞරුෂත්වය. | 03 | |
| **06.** | එකතුව | | **100** |

*සටහන* - යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරනු ලබන සහතික පත්වල අදාළ කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම්, එවැනි සහතික පත්‍රවලට අදාළ කාල සීමාවන් අදාළ ආයතනය මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාල සීමාවක් සඳහන්ව නොමැති සහ කාල සීමාව තහවුරු නොකළ සහතික පත්‍ර ලකුණු ලබාදීම සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

7. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය* :

යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්‍රවල මුල් පිටපත් සහ අයදුම්කරු විසින් ම නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකීය රියැදුරු බලපත්‍රය

8. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය* :

i. අයදුම්පත් **2025.09.26** වැනි දිනට හෝ ඊට ප්‍රථම "පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, සුහුරුපාය, බත්තරමුල්ල." යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව 01 සිට 08 දක්වාත් දෙවැනි පිටුව 09 සිට 10 දක්වාත් තෙවැනි පිටුව 11 සිට 14 දක්වාත්වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

iii. අයදුම්පත බහාලන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "සංචාරක බංගලා භාරකරු III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

iv. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු / සාමදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු හෝ රු.82,150/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

v. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

vi. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

9. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවය අවසන් කිරීමට / සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

11. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කරුණක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා සතුවේ.

12. අයදුම්පත්‍රය drp.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ද බාගත කළ .

කොමසාරිස් ජනරාල්,
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව.

2025 අගෝස්තු මස 28 වැනි දින,
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ**
**ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ සංචාරක බංගලා භාරකරු තනතුර සඳහා**
**විවෘත පදනම මත බඳවා ගැනීම - 2025**

| | |
|---|---|
| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න. සිංහල - 2 / දෙමළ - 3 / ඉංග්‍රීසි - 4)

**සටහන :-** අයදුම් කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කළ නොහැකි වේ.

---

1.0 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) (සිංහලෙන්/දෙමළෙන්) : .............................................................................
.............................................................................

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : .............................................................................
.............................................................................

1.3 මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) : .............................................................................
*උදා* - ඒ.එම්.එන්.පෙරේරා

1.4 මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : .............................................................................

2.0 2.1 ස්ථිර ලිපිනය : ..........................................................................
(සිංහලෙන්/ දෙමළෙන්) ..........................................................................

2.2 ස්ථිර ලිපිනය : ..........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................................................

2.3 පෞද්ගලික දුරකථන අංක:

ස්ථාවර : ....................................... ජංගම: ...........................................

3.0 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

4.0 උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

5.0 අයදුම්පත භාරගන්නා අවසාන දිනය වන 2025.09.26 දිනට වයස :

අවුරුදු : | | | මාස : | | | දින : | | |

6.0 ස්ත්‍රී/ පුරුෂ භාවය : .......................

7.0 විවාහක / අවිවාහක බව : .......................

8.0 ජාතිය : .......................

9.0 අධ්‍යාපන සුදුසුකම් :

9.1 අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය :

වර්ෂය : ............................................
විභාග අංකය : ............................................
මාධ්‍යය : ............................................

| අනු. අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |

9.2 අ.පො.ස. උසස් පෙළ විභාගය :
වර්ෂය : ............................................
විභාග අංකය : ............................................
මාධ්‍යය : ............................................

| අනු අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

10.0 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ යෙදී සිටින්නේ නම්,
10.1 සේවා ස්ථානය: ....................................................................................
10.2 දැනට දරන තනතුර: ...............................................................................
10.3 එම තනතුරට පත් වූ දිනය: .....................................
10.4 තනතුරේ ස්වභාවය:
ස්ථිර/ තාවකාලික/ අනියම්/ ආදේශක ද යන වග: ............................................

11.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? ඔව්/ නැත
ඔව් නම්, තොරතුරු සඳහන් කරන්න ..................................................................................

12.0 අයදුම්කරුගේ සහතිකය :
i. මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනුම අනුව සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.
ii. මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහ කිරීමට යටත්වන බව දැන සිටිමි.
iii. මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

................................. ........................................................
දිනය අයදුම්කරුගේ අත්සන

13.0 **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................ මයා/ මිය/ මෙය මා පුද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය මා ඉදිරිපිට දී .............................. දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

.................................................
සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව

නම :.......................................
තනතුර :.......................................
ලිපිනය :.......................................
දිනය :.......................................

14.0 **දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය :**

**(**රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ යෙදී සිටින අයදුම්කරුවන් සඳහා පමණි**)**

.................................................................................... මයා/ මිය/ මෙය මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ස්ථිර / තාවකාලික / අනියම් ............................... (තනතුර) වශයෙන් සේවය කරන බවත්, මේ තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

........................... ............................................................
දිනය දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව

09-23

---

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල "ක්වාසි" තනතුරු සඳහා ක්වාසි විනිසුරුවරුන් පත්කිරීම - 2025

**පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්හට මේ සඳහා අයදුම් කළ හැක.** :

අයදුම්කරු මුස්ලිම් පුරුෂයකු විය යුතු අතර, පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලීම් සහතිකයක් දරන්නකු හෝ නීතිඥවරයකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විය යුතු ය.

දැනට රාජ්‍ය සේවයේ නියුතු අයකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරු ඉස්ලාම් ආගම පිළිබඳ මනා දැනුමක් ඇති, වයස අවුරුදු 40 ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත හා ඉස්ලාම් නීතිය පිළිබඳ විශේෂිත වූ මනා දැනුමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයකු විය යුතු ය.

තෝරා ගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත් කරනු ලැබේ.

ක්වාසිවරයකු තමා පත්කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිරව පදිංචි වී සිටීම නීතිමය වශයෙන් අවශ්‍ය ය.

ක්වාසිවරයා හට මසකට රුපියල් 7,500 ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 6,250 ක ගෙවීමක් කරනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්වාසි" යනුවෙන් සඳහන් කොට **2025 ඔක්තෝබර් මස 03 වැනි දින** හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතු ය. අයදුම්පත් සමග ලිපි ලේඛනාදියෙහි මුල්පිටපත් එවිය යුතු නොවේ.

ආනන්දි කනගරත්නම්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ. පෙ. 573, අලුත්කඩේ,
කොළඹ 12,
2025 සැප්තැම්බර් මස 04 වැනි දින.

උපලේඛනය

| | ක්වාසි අධිකරණය | ක්වාසි අධිකරණ කලාපය |
|---|---|---|
| 01 | බෝරා ප්‍රජාව | ශ්‍රී ලංකා බෝරා ප්‍රජාව |
| 02 | කල්මුණේ | අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
| 03 | පොළොන්නරුව | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පොළොන්නරුව අධිකරණ කලාපය |
| 04 | යාපනය | යාපනය දිස්ත්‍රික්කයේ යාපනය, පේදුරුතුඩුව හා කයිට්ස් අධිකරණ කලාපය |

**1965 අංක 1 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත්වලින් සංශෝධිත මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 වැනි පරිච්ඡේදය) යටතේ ක්වාසිවරයකු පත්කිරීමේ ඉල්ලුම්පත්‍රය**

ක්වාසි බල ප්‍රදේශය :-

1. මුලකුරු සමග නම :

උ: අබ්දුර් රහ්මාන් එම්. අයි.

2. සම්පූර්ණ නම :

උ: මුහම්මදු ඉස්හාක් අබ්දුර් රහ්මාන්

3. ස්ථිර පදිංචිය :

4. ලිපිනය :

5. උපන් දිනය : | ව | ව | ව | ව | මා | මා | දි | දි |

6. වයස :

7. ජාතිය :

8. ආගම :

9. ජා.හැ.ප. අංකය :

10. දුරකතන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |

11. අධ්‍යාපන සුදුසුකම් :

1. ……………………………………………………………………………………………
2. ……………………………………………………………………………………………
3. ……………………………………………………………………………………………
4. ……………………………………………………………………………………………
5. ……………………………………………………………………………………………

12. වෘත්තීය සුදුසුකම් :

1. ……………………………………………………………………………………………
2. ……………………………………………………………………………………………
3. ……………………………………………………………………………………………
4. ……………………………………………………………………………………………
5. ……………………………………………………………………………………………

13. කියවීමට හා ලිවීමට හැකි භාෂාවන් :

14. ඉස්ලාම් නීතිය පිළිබඳ දැනීමක් තිබේ ද?: ඔව් ☐ නැත ☐

15. විවාහක ද? : ඔව් ☐ නැත ☐

16. භාර්යාව ජීවත්ව සිටී ද? ඔව් ☐ නැත ☐

17. ඉහත දී කරන ලද සහ දැනට කරන රක්ෂා (දිනත් සමඟ) :

| සිට | දක්වා | රැකියාව | ස්ථානය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

18. ඉල්ලුම්කරු සතු දේපළවල වටිනාකම : රු.

19. මාසික ආදායම : රු.

20. කොපමණ ණය ගැතිද, ඇතොත් ? : රු.

21. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද? : ඔව් ☐ නැත ☐

22. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද? : ඔව් ☐ නැත ☐

23. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුනේ ද? තිබේ ද? : ඔව් ☐ නැත ☐

24. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :

25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වගකිවයුතු පුද්ගලයින් විය යුතු ය.) :

| | |
|---|---|
| නම: | නම: |
| ලිපිනය: | ලිපිනය: |
| දුරකථන අංක: | දුරකථන අංක : |
| රැකියාව : | රැකියාව: |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය: | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය: |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

.........................................., ...................................,
දිනය ඉල්ලුම්කරුගේ අත්සන.

***සටහන:-***

සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න.

09-37

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

අම්පාර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :-

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.).

04. විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2025 ඔක්තෝබර් මස 07** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2025 අගෝස්තු මස 19 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අම්පාර | අඩ්ඩාලච්චේන | දීඝවාපි කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ අඩ්ඩාලච්චේන කොට්ඨාසයේ (සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (සිංහල මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර. |
| අම්පාර | පදියතලාව | සේරංකඩ කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ බින්තැන්න පත්තුව කොට්ඨාසයේ (උඩරට/සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (සිංහල මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර. |

09-39

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### වෙබ් සංස්කාරක (ඉංග්‍රීසි/සිංහල) තනතුර

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින වෙබ් සංස්කාරක (ඉංග්‍රීසි/සිංහල) තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ 2025.09.21 දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තමන් අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැකිය).

**පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව - 01**

**1. වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය - **රු.74,810-9x1,360/6x1,670-97,070/-** වේ.
(සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.114,715/- පමණ වේ).

**2. වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ).

**3. අධ්‍යාපන සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් පිරිනමන ලද පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය/තොරතුරු පද්ධති පිළිබඳ උපාධියක් තිබීම ;

*සහ*

සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් ද සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වී තිබීම.

**4. වෘත්තීය සුදුසුකම් :-**

පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරන ලද Java වැනි ක්‍රමලේඛන භාෂා සහ Java Script හා PHP වැනි ස්ක්‍රිප්ටින් භාෂා පිළිබඳ සහතිකයක් ලබා තිබීම

*සහ*

MySQL/MSSQL වැනි දත්ත පදනම් කළමනාකරණ පද්ධති සහ Apache, IIS වැනි වෙබ් සර්වර් පිළිබඳ සහතිකයක් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

**5. පළපුරුද්ද:-**

සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වෙබ් සංස්කරණය හෝ සංවර්ධනය පිළිබඳ වසර තුනක (03) පළපුරුද්දක් තිබීම.

**6. බඳවා ගැනීමේ ක්‍රමය:-**

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**7. පරීක්ෂණ පටිපාටිය :-**

(අ) ලිඛිත/වෘත්තීය පරීක්ෂණය -

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයේ දී රැකියා කාර්යභාරය හා සම්බන්ධව අයදුම්කරුවන්ගේ දැනුම සහ අවබෝධය පරීක්ෂා කර බලනු ලබන අතර, ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100).

(ආ) සම්මුඛ පරීක්ෂණය

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කෙරෙනු ලැබේ.

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයෙන් ලකුණු හතළිහකට (40) ඉහළ ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහි දී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100) :-

| *අනු අංකය* | *නිර්ණායක* |
|---|---|
| 1 | අමතර අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | රැකියා පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්‍ෂණයේ දී දක්වන කුසලතා |

**8. සේවා නියමයන් හා කොන්දේසි :-**

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයට අදාළවන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තා ලබා ගනු ඇත.

9. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය:-

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඇ) වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

10. රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

11. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

12. අයදුම්පත්‍රයෙහි සඳහන්වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

13. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන (දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරනු ලබන්නේ නම්) හෝ ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කුෂානි රෝහණදීර,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2025 සැප්තැම්බර් මස 02 වැනි දින.
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ආදර්ශ අයදුම්පත්‍රය

.............................................................. තනතුර

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) : ..........................................................................................................
..........................................................................................................

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්): ..........................................................................................
..........................................................................................................
..........................................................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්): ..........................................................................................
..........................................................................................................
..........................................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

03. (අ) පෞද්ගලික ලිපිනය : .............................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................

දුරකථන අංකය : | | | | | | | | | | |

වට්ස්ඇප් අංකය : | | | | | | | | | | |

(ආ) කාර්යාලයීය ලිපිනය : ..................................................................................................
..................................................................................................
..................................................................................................

දුරකථන අංකය : | | | | | | | | | | |

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය :

පෞද්ගලික ☐ කාර්යාලයීය ☐

04. (අ) උපන් දිනය : .......................................
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතු ය)

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස: අවුරුදු........ මාස........ දින........

05. සිවිල් තත්ත්වය : .......................................

06. ස්ත්‍රී/පුරුෂ භාවය : ......................................

07 . ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව : ( ඔව් / නැත )

08. අධ්‍යාපන සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

අ.පො.ස. (උ/පෙළ) විභාගය

| *විෂයය* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

අ.පො.ස. (සා/පෙළ)

| *විෂයය* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

09. වෘත්තීය සුදුසුකම්: (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

| පාඨමාලාව | ආයතනය | බලපැවැත්වෙන දිනය |
|---|---|---|
| | | |
| | | |

10. පළපුරුද්ද: (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය)

| ආයතනය | තනතුර | සේවා කාලය |
|---|---|---|
| | | |
| | | |

11 . වත්මන් රැකියාව පිළිබඳ විස්තර:-
(අ) ආයතනයේ නම හා ලිපිනය: .................................................................................
(ආ) මුල් පත්වීමේ දිනය: ........................................................................................
(ඇ) දැනට දරන තනතුර: .........................................................................................
(ඈ) මාසික මූලික වැටුප: .........................................................................................
(ඉ) දීමනා: ...........................................................................................................
(ඊ) දළ වැටුප: .......................................................................................................

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? ( ඔව් / නැත )
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න.
..........................................................................................................................

13. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? ( ඔව් / නැත )
එසේ නම් එම විස්තර සඳහන් කරන්න.
..........................................................................................................................

මවිසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතුවන බව දනිමි.

....................................................
අයදුම්කරුගේ අත්සන

දිනය :..............................

<u>දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය</u>

(රාජ්‍ය ආයතනවල/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල
සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ........................................... තනතුර දරන, ................................................... මයා / මිය / මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු / ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති / නොමැති බවත්, ඔහුගේ / ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න.).

.....................................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

දිනය :..............................

09-73

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය
## (2025 අංක 18 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත)

ළමා සහ අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව
2025 (දෙවන කණ්ඩායම - ප්‍රධාන බඳවාගැනීම)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ ළමා සහ අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව හරහා ළමා මනෝ විද්‍යාව සහ අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳව මූලික දැනුමක් ලබාගැනීමට හෝ ළමා සහ අධ්‍යාපන මනෝවිද්‍යාව සිය උසස් අධ්‍යාපනය සඳහා හැදෑරීමට උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට ඉල්ලුම් කළ හැකිය.

**සුදුසුකම්** : අ. පො. ස. (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් ලබාගත් S 3 සාමාර්ථය සහිතව සමත්වීම සහ 2025.10.05 දිනට වයස අවුරුදු 18ට වැඩි වීම, යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

**පාඨමාලාවේ ස්වභාවය** : මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය)

**මාධ්‍ය** : සිංහල හෝ ඉංග්‍රීසි

**පාඨමාලා කාලය** : සය මාසික අර්ධ කාලීන පාඨමාලාවකි. පහසු දිනයක් තුළ නැරඹිය හැකි පටිගත කළ දේශන සහ අතිරේක කියවීම් ඇතුළත් අන්තර්ජාල සබැඳියාවන් දේශන තුළ දී ලබා දේ.

**පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු** :
මුළු පාඨමාලා ගාස්තුව රු. 15,000.00 කි. පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 1000 ක ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තුව ගෙවිය යුතුය. රු. 15,000 ක මුදල එකවර හෝ රු. 2,500 බැගින් සය මාසිකව ගෙවිය හැකි ය.

**පාඨමාලාව සඳහා අයදුම් කළයුතු ආකාරය :**
අයදුම්කරු විසින්,

1. තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍ර යේ ඉදිරි සහ පිටුපස ඡායාරූපය,
2. අ. පො. ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනයේ ඡායාරූපය,
3. තම වර්ණවත් පැහැදිලි ඡායාරූපය (මාර්ගගත ශිෂ්‍ය හැඳුනුම්පත සැකසීම සඳහා),

070-419 1660 (WhatsAPP) අංකයට යොමු කළ යුතු ය.

**පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් බඳවාගන්නා අවසාන දිනය** : **2025/10/05** වේ.

**වැඩි විස්තර සඳහා** : කාර්යාලයීය වේලාවන්වන පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා 032-313 7500 දුරකථන අංකය හරහා විමසිය හැකිය.

ලේඛකාධිකාරී,
මනෝවිද්‍යාව සහ විශේෂ අවශ්‍යතා අධ්‍යාපන දෙපාර්තමේන්තුව.
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

09-13

**ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය**

(2025 අංක 18 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත)

ව්‍යාපාර කළමනාකරණය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව
ව්‍යාපාර අධ්‍යයනය සහ මානව සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව

2025 (ප්‍රථම කණ්ඩායම - අතිරේක බඳවාගැනීම)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ ව්‍යාපාර කළමනාකරණය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව හරහා ව්‍යාපාර කළමනාකරණය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳව මූලික දැනුමක් ලබාගැනීමට හෝ ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රය හරහා සිය උසස් අධ්‍යාපනය සඳහා හැදෑරීමට උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට ඉල්ලුම් කළ හැකිය.

**සුදුසුකම් :**

අ. පො. ස. (සා. පෙළ) සියලුම විෂයන් එකවර සමත්වීම හෝ අ. පො. ස. (උ. පෙළ) සමත්ව තිබීම.

2025/10/05 දිනට වයස අවුරුදු 18ට වැඩි වීම, යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

**පාඨමාලාවේ ස්වභාවය** : මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය)

**මාධ්‍ය** : සිංහල හෝ ඉංග්‍රීසි

**පාඨමාලා කාලය** : සය මාසික අර්ධ කාලීන පාඨමාලාවකි. පහසු දිනයන් තුළ නැරඹිය හැකි පටිගත කළ දේශන සහ අතිරේක කියවීම් ඇතුළත් අන්තර්ජාල සබැඳියාවන් දේශන තුළ දී ලබා දේ.

**පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු :**
මුළු පාඨමාලා ගාස්තුව රු. 18,000.00 කි. පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 1000 ක ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තුව ගෙවිය යුතුය.
රු. 18,000 ක මුදල එකවර හෝ රු. 3,000 බැගින් සය මාසිකව ගෙවිය හැකි ය.

**පාඨමාලාව සඳහා අයදුම් කළයුතු ආකාරය :**
අයදුම්කරු විසින්,

1. තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ/ඉදිරි සහ පිටුපස ඡායාරූපය,
2. අ. පො. ස. (සා. පෙළ) /අ. පො. ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනයේ සත්‍ය ඡායාරූපය,

070-550 8778 (WhatsAPP) අංකයට යොමු කළ යුතු ය.

**පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් බඳවාගන්නා අවසාන දිනය** : 2025/10/05 වේ.

**වැඩි විස්තර සඳහා** : කාර්යාලයීය වේලාවන් වන පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා 037-317 0999 දුරකථන අංකය හරහා විමසිය හැකිය.

ප්‍රධානී,
මනෝවිද්‍යාව සහ විශේෂ අවශ්‍යතා අධ්‍යාපන දෙපාර්තමේන්තුව.
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

09-14

**ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය**
**(2022 අංක 105 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත)**

චීන භාෂාව පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව (Advanced Certificate in Chinese) - 2025

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ චීන භාෂාව පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව (Advanced Certificate in Chinese) - 2025 සඳහා සාමාන්‍යපෙළ පිරිස්, උසස් පෙළ අවසන් කළ ශිෂ්‍යයින්, විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින් සහ උපාධිධාරීන්, රාජ්‍ය සහ පෞද්ගලික අංශයෙහි රැකියාවෙහි නියුතු පිරිස්, අධ්‍යාපනික සහ වෘත්තීයමය කටයුතු සඳහා විදේශගත වීමට සිටින පිරිස්, ව්‍යවසායකයන් සහ සංචාරක කර්මාන්තයේ නියුතු පිරිස් සඳහා සහ තම භාෂාමය දැනුම නවීන වාණිජ සමාජයට අනුව ගොඩනගා ගැනීමට උනන්දුවක් දක්වන පහත සුදුසුකම් සපුරා ඇති සැමට අයදුම්පත් කැඳවා ඇත.

**සුදුසුකම්** : අ. පො. ස. (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් ලබාගත් S සාමාර්ථ 3 සහිතව සමත්වීම;

*හෝ*

අ. පො. ස. සාමාන්‍යපෙළ චීන භාෂාව විෂය සඳහා සාමාර්ථයක් සහිත වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම.

**පාඨමාලාවේ ස්වභාවය** : මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය)

**ඉගැන්වීම් ක්‍රමවේදය** : සජීවී Zoom දේශන හරහා ඉගැන්වීම් සිදුකරනු ලබන අතර පටිගත දේශන LMS පද්ධතිය හරහා නැරඹිය හැක.

**මාධ්‍ය** : චීන (සිංහල/ඉංග්‍රීසි)

**පාඨමාලා කාලය** : මාස 06 කි.

**පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු** :
සම්පූර්ණ පාඨමාලාව සඳහා අයකිරීම රු. 18,000.00 කි.
පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 1000 ක මුදලක් ලියාපදිංචි ගාස්තුව වශයෙන් ගෙවිය යුතුය.
රු. 18,000 ක මුදල එකවර හෝ වාරික 06කින් ගෙවා අවසන් කල හැකිය.

පාඨමාලාව සඳහා අයදුම් කළයුතු ආකාරය :
අයදුම්කරුවන් විසින්,

1. තම ජාතික හැඳුනුම්පතේ ඉදිරිපස සහ පසුපිට ඡායාරූපය,
2. අ. පො. ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනයේ සහ වෙනත් අධ්‍යාපනික සහතික ඡායාරූප,
3. තම වර්ණවත් පැහැදිළි ඡායාරූපයක්,

076 4956612 (WhatsAPP) අංකයට යොමු කළ යුතු ය.

පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් බඳවාගන්නා අවසාන දිනය : **2025/09/25** වේ.

*වැඩි විස්තර සඳහා* : කාර්යාලයීය වේලාවන් වන පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා 081-3171155 දුරකථන අංකය හරහා විමසිය හැකිය.

ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

09-38/1

**ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය**
(2022 අංක 105 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත)

අධ්‍යයන, සෞඛ්‍ය සහ වෘත්තීය පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව - 2025
(ප්‍රධාන බඳවාගැනීම)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ අධ්‍යයන, සෞඛ්‍ය සහ වෘත්තීය පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්, උසස් පෙළ අවසන් කළ ශිෂ්‍යයින්, ඕනෑම අංශයක් යටතේ අධ්‍යාපනයේ නිරත ශිෂ්‍යයින්, රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියා නියුතු පිරිස්, විදේශගතව සිටින, විදේශගත වීමට බලාපොරොත්තුවෙන් සිටින පිරිස්, සමාජයේ නව දැනුම නිර්මාණය කිරීමට උත්සුක පිරිස් හට සෞඛ්‍ය අංශයේ පිරිස සහ පරේයේෂණ ක්‍රමවේදය පිළිබඳව උනන්දුවක් දක්වන පහත සුදුසුකම් සපුරා ඇති අයට අයදුම්පත් කැඳවා ඇත.

**සුදුසුකම්** : අ. පො. ස. (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් ලබාගත් S සාමාර්ථ 3 ක් සහිතව සමත්වීම ;

*හෝ*

වෘත්තීය සහ අධ්‍යාපනික වශයෙන් සලකා බැලිය හැකි වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

**ඩිප්ලෝමාවේ ස්වභාවය** : මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය)

**ඉගැන්වීම් ක්‍රමවේදය** : සජීවී ඉගැන්වීම්, පහසු දිනයක් තුළදී නැරඹිය හැකි පටිගත කරන ලද දේශන සහ නිබන්ධන ලබාදීම සිදුකෙරේ.

**මාධ්‍ය** : සිංහල හෝ ඉංග්‍රීසි

**පාඨමාලා කාලය** : මාස 06 කි.

**පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු** :
ඩිප්ලෝමාව සඳහා අයකිරීම රු. 18,000 කි. ඩිප්ලෝමාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 1000 ක මුදලක් ලියාපදිංචි ගාස්තුව වශයෙන් ගෙවිය යුතුය.

රු. 18,000 ක මුදල එකවර හෝ වාරික 06කින් ගෙවා අවසන් කල හැකිය.

පාඨමාලාව සඳහා අයදුම් කළයුතු ආකාරය :
අයදුම්කරුවන් විසින්,

1. තම අනන්‍යතාවය තහවුරු කළහැකි ලේඛනයක ඡායාරූප (ජාතික හැඳුනුම්පත/රියදුරු බලපත්‍රය/ගුවන්ගමන් බලපත්‍රය),
2. අ. පො. ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනයේ සහ වෙනත් අධ්‍යාපනික සහ වෘත්තීය සහතික ඡායාරූප
3. තම වර්ණවත් පැහැදිළි ඡායාරූපයක්

071 913 6683 (WhatsAPP) අංකයට යොමු කළ යුතු ය.

*වැඩි විස්තර සඳහා* : කාර්යාලයීය වේලාවන් වන පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා 081-3169800 දුරකථන අංකය හරහා විමසිය හැකිය.

ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

09-38/2

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

## ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහාවන දෙපාර්තමේන්තු විභාගය - 2025 සැප්තැම්බර්

2014.10.11 වැනි දින හා අංක 1883/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර, එනම් වසර දෙකක කාලයක් ඇතුළත හා දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් ස්ථිර කිරීමට පෙර එකී පත්වීම් දින සිට තෙවසරක කාලයක් ඇතුළත සමත් විය යුතුවන දෙපාර්තමේන්තු විභාගය **2025.11.02** වැනි දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02. සුදුසුකම් :

අදාළ විභාගය සම්පූර්ණ කර නොමැති, ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්ට සහ පත්වීම ස්ථිර නොකරන ලද දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ට මෙම විභාගයට අයදුම් කළ හැක. තව ද, පූර්වයෙහි මෙම දෙපාර්තමේන්තු විභාගය සම්පූර්ණ නොකරන ලද වෛද්‍ය නිලධාරීන් පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියේ තනතුරකට පත්කර ඇත්නම් එම නිලධාරීන්ට ද මෙම විභාගයට අයදුම් කළ හැක.

03. අයදුම්පත් :

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් අධ්‍යක්ෂ (විභාග), සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, "සුවසිරිපාය", කොළඹ 10, යන ලිපිනයට **2025.09.19** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහාවන දෙපාර්තමේන්තු විභාගය - 2025 සැප්තැම්බර්" ලෙස සඳහන් කළ යුතුය. මෙම දෙපාර්තමේන්තු විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපිගොනු භාර නිලධාරියා විසින් ද, සෑම අයදුම්පත්‍රයක ම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතිකකර තිබීම අනිවාර්ය වේ. තම අයදුම්පත සමග රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු. 110.00 ක් වටිනා මුද්දර ඇළවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවර (01) ක් ද එවිය යුතු ය. (ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ද අසම්පූර්ණ හෝ වැරදි සහිතවන අයදුම්පත් ද කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

***සැ. යු.*** : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය A4 වර්ගයේ කඩදාසියක පළමු පිටුවේ අංක 1 සිට 4 (ඉ) දක්වාත් දෙවන පිටුවේ අංක 4 (ඊ) සිට අංක 9 දක්වාත් සකස් කළ යුතු ය. ඉහත ආකෘතියට අනුකූල නොවන සහ අසම්පූර්ණ සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විභාග ගාස්තු :

(i) විභාගයට පළමු වරට ඉදිරිපත්වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25.00 බැගින් අවලංගු නොකළ මුද්දර අයදුම්පත්‍රයේ අලවා තමන්ගේ අත්සන සහ දිනය යොදා ඒවා නිසිලෙස අවලංගු කළ යුතු ය.

(ii) කිසිඳු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. විභාගයට ඇතුළත් කර ගැනීම :

(i) පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(ii) විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළ දී විභාග ශාලාධිපතිවරයාට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත,
(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත,
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය,
(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය,

(iii) කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් මත විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පරීක්ෂාකර මධ්‍යස්ථානය සහ විභාග අංකය සොයාගත හැකි ය. එසේ ඔබේ නමට අදාළ විභාග අංකය සහ විභාග මධ්‍යස්ථානය සොයා ගත්තේ නම්, ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධාරියා වෙතින් අත්සන සහතික කරන ලද ලිපියක් ද සමග වෙබ් අඩවියේ සඳහන්ව තිබූ විභාග මධ්‍යස්ථානයට පැමිණ ඔබේ අනන්‍යතාවය තහවුරුකර විභාගයට පෙනී සිටිය හැකිය. ප්‍රවේශ පත්‍ර ලැබුණු අයදුම්කරුවන් අත්සන සහතිකකර රැගෙන පැමිණිය යුතුය. අත්සන සහතික කරන ලද ලිපිය හෝ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවන් හට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.
**(වෙබ් අඩවිය** - www.health.gov.lk)

06. විභාග පරිපාටිය :

මෙම විභාගය ලිඛිත, රචනා ප්‍රශ්න පත්‍ර තුනක් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයක් වශයෙන් කොටස් හතරකින් සමන්විතය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100ක් බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50 ක් ලබාගත යුතු ය. එක් වරක දී හෝ කිහිප වරක දී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකි ය. නිලධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ දී අදාළ සියලුම විෂයයන්ට පෙනී සිටිය යුතු ය.

07. විභාග විෂයය නිර්දේශ මාලාව :

**07:1 ලිඛිත විභාගය :**

**07:1:1 ආයතන සංග්‍රහය ප්‍රශ්න පත්‍රය**

කාලය පැය 02 යි. ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය.

*විෂයය නිර්දේශය :*

(i) සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පොදු රෙගුලාසි,

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති හා රෙගුලාසි,

(iii) ආයතන සංග්‍රහය

*I කොටස* - VI, VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XXIII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXI, XXXII පරිච්ඡේදයන්,

*II කොටස* - XLVII සහ XLVIII යන පරිච්ඡේදයන්.

**07:1:2 රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය ප්‍රශ්න පත්‍රය :**
කාලය පැය 1 1/2 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

*විෂයය නිර්දේශය :*

**සෞඛ්‍ය සේවා සංග්‍රහය -**

(i) රෝහල් හා මහජන සෞඛ්‍ය පරිපාලනය
(ii) රසායනාගාර සේවා කළමනාකරණය
(iii) ඖෂධ කළමනාකරණය.

07:1:3 ගිණුම් ප්‍රශ්න පත්‍රය :

කාලය පැය 02 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

*විෂයය නිර්දේශය :*

(i) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තොග කළමනාකරණය හා ගිණුම්කරණ රෙගුලාසි.

(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පළකරනු ලැබූ කළමනාකරණ අත් පොතෙහි මූල්‍ය කොටස.

(iii) වෛද්‍ය නිලධාරීන් සඳහා දෛනික පරිපාලන රාජකාරි සඳහා අදාළවන රාජ්‍ය මූල්‍ය රෙගුලාසි.

| | | |
|---|---|---|
| පරිච්ඡේද I | - | මු. රෙ. 1, 2, 78 |
| පරිච්ඡේද II | - | මු. රෙ. 90, 91, 101, 102, 103, 104, 105, 106, 107, 108, 109, 110, 113, 115, 118, 119 |
| පරිච්ඡේද III | - | මු. රෙ. 124, 125, 126, 127, 128, 131, 133, 134, 135, 136, 137, 138, 139, 140, 142, 143, 151, 152, 154, 155, 156, 189 |
| පරිච්ඡේද V | - | මු. රෙ. 200, 201, 215, 225, 238, 245, 255, 257, 260 |
| පරිච්ඡේද VI | - | මු. රෙ. 380, 381, 382, 383, 384, 385, 386, 388, 389, 390, 391, 392, 393, 394 |
| පරිච්ඡේද VII | - | මු. රෙ 488, 493 |
| පරිච්ඡේද XIII | - | මු. රෙ 715, 716, 756, 757, 758 |

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

1 වැනි පරිච්ඡේදය - සියලුම වගන්ති.
2 වැනි පරිච්ඡේදය - 2.3, 2.4, 2.5, 2.6, 2.7, 2.8
3 වැනි පරිච්ඡේදය - 3.1, 3.2, 3.3, 3.4, 3.5, 3.6, 3.7, 3.8, 3.9

07:2 සිංහල/දෙමළ වාචික පරීක්ෂණය :

සිංහල/දෙමළ භාෂා ප්‍රවීණතාවය මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙන යාමේ දී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහල මාධ්‍ය නිලධාරීන්ට දෙමළ මාධ්‍යයෙන් ද, දෙමළ මාධ්‍ය නිලධාරීන්ට සිංහල මාධ්‍යයෙන් ද සන්නිවේදනය කිරීමට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ. කාලය විනාඩි 10කි.

08. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම :

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොළයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීම ද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන් ද වැළකී සිටිය යුතුය. තවද, ජංගම දුරකතන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණ ද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත්වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයෙහි නියුතු අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත.

සැ. යු.- මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයන් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2025 අගෝස්තු මස 27 වැනි දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**ආදර්ශ අයදුම්පත**

ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්
සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2025 සැප්තැම්බර්

01 (අ) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) :......................................................................................

..........................................................................................................................................................

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(iii) මුලකුරු සමග නම (සිංහලෙන්) :......................................................................................

..........................................................................................................................................................

(iv) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(ආ) (i) නිල නාමය (අදාළ කොටුව තුළ ( ✓ ) ලකුණ යොදන්න.

I වෛද්‍ය නිලධාරි :      II දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි :

(ii) සීමාවාසික පත්වීම ලද දිනය :......................................................................................

(iii) ප්‍රාථමික ශ්‍රේණියට / II ශ්‍රේණියට පත්වීම ලද දිනය :......................................................................

02. ඔබ මෙවර විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ (✓) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (x) ලකුණ යොදන්න.

රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය :      ආයතන සංග්‍රහය :      ගිණුම් :

සිංහල වාචික :      දෙමළ වාචික :

03. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (අදාළ කොටුවේ (✓) හරි ලකුණ යොදන්න.) :

සිංහල :      ඉංග්‍රීසි :      දෙමළ :

04. (අ) (i) දැනට සේවය කරන ආයතනය (පැහැදිලිව සඳහන් කරන්න.) :......................................................

(ii) මෙම ආයතනය අයත් වන්නේ -

රේඛීය අමාත්‍යාංශයට :

පළාත් සභාවට :

(ආ) (i) පළාත් සභාවට නම්, අදාළ පළාත :................................................................................................

(ii) එය අයත් දිස්ත්‍රික්කය :..........................................................................................................

(ඇ) (i) ජංගම දුරකතන අංකය : | | | | | | | | | | |

(ii) විද්‍යුත් ලිපිනය :.......................................................................................................

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

(ඉ) පහත දක්වා ඇති මධ්‍යස්ථාන අතුරින් විභාගයට පෙනී සිටීමට කැමැති විභාග මධ්‍යස්ථානයට අදාළ කොටුවේ (✓) හරි ලකුණ යොදන්න. (දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් හෝ දක්වා ඇති මධ්‍යස්ථාන එකක් හෝ කිහිපයක් අවලංගු කරනු ලබන අතර එකී මධ්‍යස්ථානයට අයදුම් කරනු ලැබූ අයදුම්කරුවන් ආසන්නතම විභාග මධ්‍යස්ථානයකට හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරනු ලබන වෙනත් විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ.)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | | කඳාන | | හම්බන්තොට | | අම්පාර | |
| කළුතර | | ගාල්ල | | බදුල්ල | | වව්නියාව | |
| කුරුණෑගල | | අනුරාධපුර | | රත්නපුර | | පොළොන්නරුව | |
| මහනුවර | | මඩකලපුව | | යාපනය | | ත්‍රිකුණාමලය | |

(ඊ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" x 4" ප්‍රමාණයේ රුපියල් 110.00 ක මුද්දර ඇලවූ ලියුම් කවර 01ක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේ ද? :..........................................................................

(උ) (i) තැපැල් ලිපිනය (සිංහලෙන්) :.................................................................................................
.......................................................................................................................................

(ii) තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :.............................................................................
.......................................................................................................................................

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේ ද ? :...........................................................................

(ආ) විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් මුද්දර අලවා තිබේ ද? :........................................................

*මුද්දර කොටුව (මුද්දර අලවා ඒ මත අත්සන තබන්න.)*

06. අයදුම්කරුගේ සහතිකය :

මගේ දැනුම හා විශ්වාසය පරිදි—

(i) මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්, ප්‍රථම වතාවට නොවන බැවින් රු ..... ක් වටිනා මුද්දර අලවා ඇති බවත් මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මාගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟවන බවත් සහතික කරමි.

......................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.........................................

*07.* *පෞද්ගලික ලිපිගොනු භාර විෂයය නිලධාරියාගේ/නිලධාරිණියගේ සහතිකය :*

මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පෙර/පසු මා වෙත භාරදුන් බවත්, මෙම විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදි ව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

......................................,
නම සහ අත්සන.

දිනය :.........................................

*08.* *ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

....................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියකු*/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියකු* වන/අතර, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට වන*/නොවන* බවට ද රු. ...................... ................ ක් වටිනා මුද්දර මෙම මුද්දර අයදුම්පත්‍රයට අලවා ඇති බව ද*/මුද්දර* ඇලවීමට අනවශ්‍ය බවට ද, මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද සහතික කරමි.

......................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය)

දිනය :.........................................

*09.* *විමධ්‍යගත කොට්ඨාස / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය :*

....................................... මහතා*/මහත්මිය*/මෙනවිය*, වෛද්‍ය නිලධාරියකු*/ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියකු* වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

......................................,
විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර
ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය).

දිනය :.........................................
* (අනවශ්‍ය කොටස් කපා හරින්න)

09-24

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2025 වර්ෂය** | | | |
| **සැප්තැම්බර්** | 2025.09.04 | බ්‍රහස්පතින්දා | 2025.08.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.09.12 | සිකුරාදා | 2025.08.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.09.19 | සිකුරාදා | 2025.09.04 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2025.09.26 | සිකුරාදා | 2025.09.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2025.10.03 | සිකුරාදා | 2025.09.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.10 | සිකුරාදා | 2025.09.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.17 | සිකුරාදා | 2025.10.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.24 | සිකුරාදා | 2025.10.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.31 | සිකුරාදා | 2025.10.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2025.11.07 | සිකුරාදා | 2025.10.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.14 | බ්‍රහස්පතින්දා | 2025.10.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.21 | සිකුරාදා | 2025.11.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.28 | සිකුරාදා | 2025.11.14 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ.බ.).

2025 ජුනි මස 09 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.